# Sri Lanka Tourism

**Sri Lanka Tourism Development Authority, 80, Galle Road, Colombo 03, Sri Lanka.**
www.sltda.gov.lk / www.srilanka.travel, Tel: +94 112 426 800/900

**<u>නිවේදනයයි</u>**

**<u>කල්පිටියේ උච්චමුනෙයි දූපත බදු දීම</u>**

ඉහත සඳහන් කරුණ පිළිබඳව මහජනතාව නොමග යන ලෙස වැරදි තොරතුරු විවිධ මාධ්‍ය වාර්තා තුළින් ප්‍රචාරය වී ඇති හෙයින්, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) මෙම කාරණය පිළිබඳව පැහැදිළි කිරීමට කැමතියි.

2005 අංක 38 දරන සංචාරක පනතට අනුව, සැලසුම් සහගතව සහ තිරසාර ලෙස සංචාරක හෝටල් සහ නිවාඩු නිකේතන සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම සඳහා SLTDA සතු ඉඩම් අනාගත ආයෝජකයින්ට බදු දීමට SLTDA වෙත නියම කර ඇත.ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය අතීතයේ දී මෙන් විදේශීය හා දේශීය ආයෝජන ආකර්ශනය කර ගනිමින් අඛණ්ඩව එය සිදු කර ඇති අතර, දැනටමත් අනුමත කර ඇති ව්‍යාපෘති සඳහා බදු ගිවිසුම් අත්සන් කිරීමේදී යම් ප්‍රමාදයක් සිදු වුවහොත් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) වෙත වගකිව යුතු වේ.

කල්පිටියේ උච්චමුනෙයි දූපත සම්බන්ධයෙන් SLTDA විසින් නිසි ක්‍රියාපටිපාටිය අනුගමනය කර ඉඩම් අන්සතු කිරීමේ ප්‍රතිපත්තියට අනුව වසර 30කට එම දේපළ විදේශීය ආයෝජකයෙකුට බදු දීමට අවශ්‍ය සියලුම අනුමැතින් ලබාගෙන ඇත. ඩොලර් මිලියන 417.5 ක ව්‍යාපෘතියක් සඳහා 2020 අගභාගයේදී අනුමත කිරීමේ ක්‍රියාවලිය අවසන් වූ අතර ආයෝජකයාගේ ඉල්ලීම හේතුවෙන් බදු ගිවිසුම අත්සන් කිරීම ප්‍රමාද විය.

කල්බදු ගිවිසුම අත්සන් කිරීම සඳහා ආයෝජකයාගේ නියෝජිතවරයා 2022 මැයි 8 වැනි දින ශ්‍රී ලංකාවට පැමිණි අතර, SLTDA විසින් 2022 මැයි 11 වැනි දින කල්බදු ගිවිසුමට අත්සන් තැබුවේ, ආයෝජකයා එදිනම රාත්‍රියේ දිවයිනෙන් පිටවීමට නියමිතව තිබූ බැවිනි.

ශ්‍රී ලංකාවේ සංචාරක පාර්ශවකරුවන්ගෙන් සහ ශ්‍රී ලාංකීය ජනතාවගෙන් අප කාරුණිකව ඉල්ලා සිටින්නේ පරීක්ෂාකාරී වි අසත්‍ය සහ වැරදි තොරතුරුවලට නොරැවටෙන ලෙසය.

**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය**

**2022 මැයි 12**